// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2074/47 - 2018 ජුනි මස 09 වැනි සෙනසුරාදා - 2018.06.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ (1) (අ) වගන්තිය යටතේ වෙලිඇණෙයි ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන වෙලිඇණෙයි ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ (1) (අ) වගන්තිය යටතේ වෙලිඇණෙයි ප්‍රාදේශීය සභාවේ අංක 03 - වෙලිඇණෙයි 03 කොට්ඨාසයට තේරී පත් වූ සණ්මුකම් ලෝගේස්වරන් අයත් වන්නා වූ ඉලංගෙයි තමිල් අරසු කච්චි නම් ඒ පිළිගත් දේශපාලන පක්ෂයයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වන වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම වෙලිඇණෙයි ප්‍රාදේශීය සභාවේ අංක 03 - වෙලිඇණෙයි 03 කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා රාසලිංගම් පරමේශ්වරි නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

වෙලිඇණෙයි ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි තනබාලසිංගම් අකිලන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ (1) (අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් රාසලිංගම් පරමේශ්වරි, වෙලිඇණෙයි ප්‍රාදේශීය සභාවේ අංක 03 - වෙලිඇණෙයි 03 කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**ටී. අකිලන්,**
තේරීම්භාර නිලධාරී,
වෙලිඇණෙයි ප්‍රාදේශීය සභාව.

2018 ජුනි මස 09 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
යාපනය.